# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1989 අංක 12 දරන පලාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1989 මැයි මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1989 ජූනි මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල: ශත 45 යි. තැපැල් ගාස්තුව: ශත 75 යි.

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත**

**[සහතිකය සටහන් කළේ 1989 මැයි මස 30 වන දින.]**

**එල්. ඩී.—ඕ. 77/88.**

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ I වන ලැයිස්තුවේ දක්වා ඇති කාරණා පිළිබඳ ලිඛිත නීතිය අර්ථ නිරූපණය කිරීම සඳහා අතුරු විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

**1.** මේ පනත 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක වීම නතර වන්නේ ය.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ I වන ලැයිස්තුවේ දක්වා ඇති කාරණය පිළිබඳ ලිඛිත නීතිය අර්ථ නිරූපණය කිරීම පිළිබඳ විධිවිධාන.**

**2.** (1) නවවන උපලේඛනයේ I වන ලැයිස්තුවේ දක්වා ඇති යම් කාරණයක් පිළිබඳව 1987 නොවැම්බර් මස 14 වන දිනට පෙරාතුව සාදන ලද යම් ලිඛිත නීතියකින්, අවස්ථාවෝචිත පරිදි, අමාත්‍යවරයකුට හෝ රජයේ නිලධරයකුට යම් බලයක් හෝ කර්තව්‍යයක් පවරා දී ඇත්තා වූ හෝ වෙන් කොට දී ඇත්තා වූ අවස්ථාවක,

(අ) ඒ බලය හෝ කර්තව්‍ය අමාත්‍යවරයකුට පවරා දී ඇත් නම් හෝ වෙන් කර දී ඇත් නම්, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, පළාතක් සම්බන්ධයෙන්, ඒ පළාතේ ආණ්ඩුකාරවරයා විසින් හෝ එම විෂය වෙන් කොට දී ඇත්තා වූ ඒ පළාතේ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා විසින් හෝ ක්‍රියාත්මක කළ හැකිය. නැතහොත් ඉටු කළ හැකිය. තව ද, ඒ අනුව එවැනි සෑම ලිඛිත නීතියකම අමාත්‍යවරයකු සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීම්, පළාතක ආණ්ඩුකාරවරයා සම්බන්ධයෙන් හෝ කර්තව්‍ය වෙන් කොට දී ඇත්තා වූ, ඒ පළාතේ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ඇතුළත් වූ සඳහන් කිරීම් ලෙස සලකනු ලැබිය යුතු ය; තව ද

(ආ) ඒ බලය හෝ කර්තව්‍ය රජයේ නිලධරයකුට පවරා දී ඇත් නම් හෝ වෙන් කර දී ඇත් නම්, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, පළාතක් සම්බන්ධයෙන්, ඒ රජයේ නිලධරයා විසින් දරන ලද ධුරයට අනුරූප ධුරයක් දරන්නා වූ පළාතේ රජයේ සේවයේ නිලධරයා විසින් ක්‍රියාත්මක කළ හැකිය. නැතහොත් ඉටු කළ හැකිය. තව ද, ඒ අනුව එවැනි සෑම ලිඛිත නීතියකම රජයේ නිලධරයකු සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීම් ඒ රජයේ නිලධරයා විසින් දරන ලද ධුරයට අනුරූප ධුරයක් දරන්නා වූ පළාතේ රජයේ සේවයේ නිලධරයකු සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ඇතුළත් වූ සඳහන් කිරීම් ලෙස සලකනු ලැබිය යුතු ය.

2—ඩී 004477—8,300 (89/04)

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ I වන ලැයිස්තුවේ දක්වා ඇති යම් කාරණයක් පිළිබඳව 1987 නොවැම්බර් මස 14 වන දිනට පෙරාතුව සාදන ලද යම් නීතියකින් යම් ආඥාවක්, ප්‍රකාශනයක්, නිවේදනයක්, නියෝගයක් හෝ රීතියක් සෑදීමට අමාත්‍යවරයකුට බලය පවරන අවස්ථාවක, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, පළාතක් සම්බන්ධයෙන්, ඒ බලය ඒ පළාතේ ආණ්ඩුකාරවරයා විසින් හෝ ඒ විෂය වෙන් කර දී ඇත්තා වූ ඒ පළාතේ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා විසින් හෝ ක්‍රියාත්මක කළ යුතු ය. තව ද ඒ අනුව ඒ බලය පවරන නීතියේ යම් විධිවිධානයක "අමාත්‍යවරයකු" සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීම්, පළාතේ ආණ්ඩුකාරවරයා සම්බන්ධයෙන් හෝ ඒ විෂය වෙන් කර දී ඇත්තා වූ පළාතේ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ඇතුළත් වූ සඳහන් කිරීම් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් පරිදි එවැනි යම් නීතියකින්—

(1) ඒ නීතිය යටතේ සාදන ලද යම් නියමයක්, ප්‍රකාශනයක්, නිවේදනයක්, නියෝගයක් හෝ රීතියක් පාර්ලිමේන්තුව ඉදිරියෙහි තැබීම සඳහා; හෝ

(2) පාර්ලිමේන්තුව විසින් එවැනි යම් නියමයක්, ප්‍රකාශනයක්, නිවේදනයක්, නියෝගයක් හෝ රීතියක් අවලංගු කිරීම හෝ අනුමත කිරීම සඳහා

විධිවිධාන සලස්වන අවස්ථාවක, ඒ නීතියෙහි පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීම්, ඒ පළාත සඳහා පිහිටුවනු ලැබූ පළාත් සභාව සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීමක් වූ විටක මෙන් ඒ පළාත සම්බන්ධයෙන් ඒ විධිවිධානය බල සහිත විය යුතු ය.

(4) මේ පනතේ "රජයේ නිලධරයා" සහ "ලිඛිත නීතිය" යන යෙදුම්වල, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඒවාට පිළිවෙළින් දී ඇත්තා වූ අර්ථය ඇත්තේ ය.